# අපි කවුද?



R. D. විහඟි නවෝදා

ISBN අංකය : 978-624-208-200-4

# අපි කවුද?

R. D. විහඟි නවෝදයා

කතෘ

මහාමායා බාලිකා විදුහල

7 – G

2025 .02 .05

ISBN අංකය : 978-624-208-200-4

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ දඹදෙනි යුග කැපී පෙනෙන්නේද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධමත් කාල පරිච්ඡේද නිසාය එසේ නම් මහාමායා ඉතිහාසයේද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මේ අයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩනඟා එය  රටේම පාසල් ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත් කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි

ඉන් ඔබ්බට යමින් මෙවර පාසාත් ප්‍රජාවම ආදිකතෘ කරදෙන අත්තදැසී හිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් හොරණ ගරනි ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනා ගනිමින් ලේඛනකරණයට ලියමු වීමේ ප්‍රතිඵලයක් ලෙස එළි දකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිව්‍ය සඳහා අත්තලක් වනු නොඅනුමානය

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය- මහනුවර.

පටුන පිටු අංකය


| | |
|---|---|
| අලුත් යාළුවා | 1 |
| නත්තල | 6 |
| ඉස්කෝලේට ඇලන් එක්ක | 12 |
| විභාගය | 19 |
| කෑම්ප් එක | 26 |
| මල්ලි | 30 |
| උත්තරේ හමු වුණා | 34 |

# අලුත් යාළුවා

"රීටා... නැගිටින්න ළමයෝ මෙච්චර වෙලා නිදාගන්නේ"

"අයියෝ අම්මා.. ඉස්කෝලෙ හිවාඩුනේ"

"පණ්ඩිත කතා කියන්නේ නැතුව නැගිටින්න. අන්න කැතීත් ඇවිල්ලා ගිහිල්ලා ඒ ළමයට කතා කරන්න"

"හා හා ..මෙච්චර උදෙන් එයාත් මොකට නැගිටිනවද මන්දා"

ඊට පස්සේ මම මූන හෝදලා ඇඳුමක් ඇඳගෙන ඉක්මනට පල්ලෙහා තට්ටුවට ගියා. ඇත්තටම කැතී ගේ නම කැතරිනා. එයා හරිම හොඳයි . මගේ හොඳම යාළුවා එයා .නත්තල නිසා අපිට ඉස්කෝලේ නිවාඩු දුන්නා. කැතී ඉන්නේ අපේ ගෙදරට අල්ලපු ගෙදර.

"හායි රීටා .මෙච්චර වෙලා මොනවද කරේ? දැන් උදේ නවයයි වෙලාව! අට හමාර වෙනකම්ම නිදාගත්තා නේද?"

"හරි හරි ඉතිං නිවාඩු දවස්වල නිදාගන්නවා ඇරෙන්න ඔයා කියන්නේ වෙනදා වගේම උදේ පාන්දර නැගිටින්න කියලද ?"

"හරි හරි දැන් ඉතිං ඕවා ගැන කතා කරලා වැඩක් නෑ . ඒක නෙවෙයි, හෙට දෙසැම්බර් මාසෙ පටන්ගන්නවා...."

"හිම වැටෙන්නත් පටන් ගනී. හරිම ෂෝක්! ලබන සතියේ ඉඳන් අපි ගෙවල් සරසන්න පටන් ගමු."

ඉන්පසු අපිට මගේ අම්මාගේ කටහඬ ඇසුණි.

"පුතේ ...එන්න කන්න .කැතීටත් එන්න කියන්න."

"හා අම්මේ..."

"කැතී, එන්න යමු කන්න"

"මම කොහොමත් මේ උදෙන්ම ආවේ ඇන්ටිගෙන් මොනවා හරි කාලා යන්න තමයි."

ඇත්තටම මේ මුළු ගමෙන්ම රසටම කෑම උයන්න පුළුවන් අපේ අම්මට .එයා උයන කෑම වල රස නම් ඇත්තටම කියලා නිම කරන්න බෑ.

"ඇන්ටිගේ කෑමනම් හරිම රසයි"

"ස්තුතියි පුතේ"

කාලා ඉවර ඉවර ඉවරවෙලා කැතීමායි ගමේ අනිත් අයත් දෙක එකතු වෙලා සෙල්ලම් කළා. අපි හොඳට විනෝද උනා. අපි පැසි පන්දු ගැහුවා . කැතීයි මායි ඇරෙන්න එතන හිටපු කිසි කෙනෙක් අපේ වයසේ අය නෙවෙයි. සමහරු අපිට වැඩිය වැඩිමල් .සමහරු බාලයි. එකපාරටම මං දැක්කා රොජ්රික් අංකල්ලගේ ගෙදර ජනේලෙන් කවුද ළමයෙක් අපි දිහා බලාගෙන ඉන්නවා. මං එයාව කැතිටත් පෙන්නුවා.රොජ්රික් අංකල් කියන්නේ අපේ ගෙදර ළඟම ඉන්න අසල්වැසියෙක් .

"කැති, අර බලන්න අතන එක ළමයෙක් අපි දිහා බලාගෙන ඉන්නවා. ඔයාට පේනවද? රොජ්රික් අංකල්ලාගේ ගෙදර දිහා බලන්නකෝ .එයාලට ළමයි  නෑ නේද?"

"අයියෝ රීටා.. පුදුමයක් නෑ ඉතින් .උදේ නවය විතර වෙනකම් කම්මැලියා වගේ නිදාගෙන දැන් ඉතින් අහනවා."

"අනේ ඒ කවුද කියන්නකෝ ..."

"රොජ්රික් අංකල්ලට ළමයි නැති නිසා අනාථ නිවාසයෙන් තමයි එයාව අරගෙන ඇවිත් තියෙන්නේ."

"අනේ පව් නේද? ඇයි එයාව අරන් ඇවිත් තියෙන්නේ?"

"ඒක කොහොමද මං දන්නේ ..එයාව අරන් ඇවිත් තියෙන්නේ ඇයි කියලා?? අනික එයාව අරන් ආපු එක කොච්චර හොඳ දෙයක්ද? අනාත නිවාසෙක ඉන්න ළමයෙකු බලා ගන්නවා කියන්නේ.."

ඊට පස්සේ අපි ආයෙත් සෙල්ලම් කරලා විනෝද උනා. සෙල්ලම් කරලා ඉවර වුණාට පස්සේ කැතීටයි මටයි බයිසිකලේ නැගලා චුට්ටක් ගම වටේ යන්න හිතුණා.

"ඒක නෙවෙයි කැති. ඒ ළමයා අපේ වයස වගේ නේද? තාම අපිව අඳුරන්නේ නැති හින්දා වෙන්න ඇති එහෙම බලාගෙන හිටියේ කවද්ද එයාව අරන් ඇවිත් තියෙන්නේ.."

"ඊයේ මං හිතන්නේ .අපේ අම්මලාගෙනුත් අහලා අපි හෙට රොජ්රික් අංකල්ලාගේ ගෙදර යමුද ? ගිහිල්ලා අර ළමයාව බලලා එමුද??"

"හා හොඳ අදහස ,එහෙනම් අපි අම්මලාගෙන් අහලා යමු "

"දැන් දවල් වෙලා රීටා. අපි දැන් ගෙදර යමු .අපි දවල් කෑමට පරක්කු වුනොත් අම්මල බනියි."

ඉතින් අපි බයිසිකලේ පැදගෙන ගියා. කැතීගේ ගෙදර මගේ ගෙදරට කලින් හම්බවෙනවා. එයා එයාගේ ගෙදරට ගියා ගියාට පස්සේ මම මගේ ගෙදරට ගියා.

"අම්මේ මං ආවා"

"සෙල්ලම් කළාද?"

"ඔව්. අදනං හරිම ෂෝක්! අම්මේ ,ඔයා දන්නවද රොජ්රික් අංකල්ලගේ ගෙදරට අලුත් ළමයෙක් ඇවිල්ලා නේද, අනාත නිවාසයකින්"

"ඔව් ,මට ආරංචි වුණා ඒක ගැන"

"අනාථ නිවාස වල ඉන්න ළමයි පව් නේද අම්මේ... අපිත් ළමයෙක් ගේමුද??"

"ආ.. මේ., එක ළමයෙක් බලාගන්නවත් මට තියෙන අමාරුවක්. අනික තව මල්ලි කෙනෙකුත් ළඟදි ඔයාට හම්බවෙනවනේ.."

"තුන්දෙනෙක් වෙන්න තව එක්කෙනෙක් අරන් එමුද?"

"අනේ මේ... කියවන්නෙ නැතුව ගිහිල්ලා අර කෑම උයල ඇති ,බෙදා ගෙන කන්නකෝ "

"අම්මේ අපි හෙට රොජ්රික් අංකල්ලගේ  ගෙදර ගිහිල්ලා අර ළමයව බලලා එන්නද ??"

"හා හා ඒක හොඳයි. ඒ ළමයත් එක්ක ටිකක් යාලුවෙලා ගම එහෙම පෙන්නන්න. මම ඔයාලට හෙට බයිසිකලේ ගිහිල්ලා කොහේ හරි ඉඳගෙන කන්න සැන්ඩ්විච්  ටිකකුත් හදලා දෙන්නම්"

***

ඊට පස්සේ දවසේ මමයි කැතියි ගිහිල්ලා අර ළමයව හම්බවෙන්න ලෑස්ති වුනා. කැති අපේ ගෙදර ආවා. ඊට පස්සේ දෙන්නම බයිසිකලේ නැගලා රොජ්රික් අංකල්ගේ ගෙදර ගියා. රොජ්රික් ඇන්ටි අපිව උණුසුම්ව පිළිගත්තා. අර ගෑණු ළමයා උඩ තට්ටේ ඉඳන් අපි දිහා බලාගෙන හිටියා. රොජ්රික්  ඇන්ටි  එයාට කතා කළා

"ඇලන් ,මෙහෙට එන්න. මෙයාලා අපේ අසල්වැසියෝ. මෙයාලාත්  ඔයාගේ වයසමයි මං හිතන්නේ .අඳුරගන්න. "ඊට පස්සේ ඇලන් පල්ලෙහාට ආවා.

"හායි ඇලන් මගේ නම රීටා. මේ ඉන්නේ කැතී." මම අපි දෙන්නව හඳුන්වලා දුන්නා.

"හායි රීටා.. හායි කැතී .."

"ඉතින් ඇලන් ,ඔයාට කොහොමද?ඔයාට වයස කීයද?"

"මට දැන් දොළහයි"

"ඇත්තට? අපිටත් දොළහයි. හරිම ෂෝක්! මේ ගමෙන් ම අපේ වයසේ හිටියේ මමයි රීටයි විතරයි..දැන් අපිට ඔයත් ඉන්නවා." කැතී කිව්වා

අපි එයත් එක්ක හොඳින් කතා කරා .ඇයත් අප සමග යාළු වුණා. ඇය ඉතා හොඳ දරුවෙක් කියලයි මට ඒ වෙලාවේ හිතුනේ .එයා හරි අහිංසක දරුවෙක් කියලත් මට හිතුනා. කැතීටත් ඒ විදිහටම හිතුනා කියලා එයා මට පස්සේ දවසක කිව්වා. එදා අපිට එහෙම හිතුනාට එයා අපිටත් වැඩිය දඟයිකියලා පස්සේ අපි දෙන්නටම හිතුනා. අපි එයත් එක්ක බයිසිකලේ ගම වටේම ගියා. ඊට පස්සේ ගහක් උඩට නැගලා අපේ අම්මා හදලා දුන්න සැන්ඩ්විචස් කෑවා. අපි සෙල්ලම් කරලා සතුටින් හිටියා අද ඉඳන් දෙසැම්බර් මාසේ පටන් ගන්න නිසා නත්තල් ගැන අපි ගොඩාක් කතා වුණා. එයා අපිට ළමා නිවාසය ගැන කිව්වා. ඒක ගොඩාක් දුක හිතෙන දෙයක් කියලා අපිට හිතුනා. මායි කැතීයි වාසනාවන්තයි කියලත් හිතුනා. ඊට පස්සේ අපි අපේ ගෙවල් වලට ගියේ හවස් වෙලා මම අම්මටත් ඇලන් ගැන කිව්වා.

"ඇලන් නම් ගොඩක් හොඳයි වගේ නේද ?ඒක නෙවෙයි පුතේ, ඔයාට සතුටු හිතෙන ආරංචියක් කියන්න තියෙනවා."

"මොකක්ද ඒ?"

"හෙට ඔයාගේ තාත්තා ගෙදර එනවා කියලා මට කිව්වා. නත්තල හින්දයි, අනික මල්ලි හින්දයි තාත්තට නිවාඩු දීලා"

"අනේ හරිම ෂෝක් තාත්තව දැන් මම දකින්නේ මාස දෙකකට පස්සේ."

"හරි හරි දැන් ඉතින් ඇඟ එහෙම හෝදලා කෑම කන්න එන්න. හවස් වෙලා."

මම හිටියේ හරිම සතුටින්. අපේ තාත්තා යුද හමුදාවේ වැඩ කරන නිසා එයාලට මේවාඩු හම්බවෙන්නේ මාස දෙකකට එක සැරයයි.  ඒ නිසා මම හිටියේ හරිම සතුටින්. එදා රෑ කාලා ඉවර වෙලා මම නිදාගත්තේ ගොඩාක් ලොකු සතුටකින්...!

***

## නත්තල

පහුවදානම් මම උදෙන්ම නැගිට්ටා. මොකද තාත්තා ගෙදර එන නිසා ගෙදර අස් කරන්න.මගේ මේ උද්යෝගය ඇතිවෙන්නේ ඇත්තටම මාස දෙකකට එක වතාවයි. නැත්නම් හැමදාම මම නිදි. මම ලස්සනට ගෙදර අස් කරලා කැතීගෙ ගෙදර ගියේ මේ සුභ ආරංචිය එයාටත් කියන්න ඕන නිසා. එයාගේ බල්ලා දොරකඩ ළඟ හිටියා. අපි සමහර දවස්වලට බයිසිකලේ යද්දි එයත් අපිත් එක්ක එනවා. එයාගේ ඇඟේ ලොම් පිරිලා. හරිම ලස්සන බල්ලෙක්.හරිම හුරතල්.එයාගේ අම්මා තමයි මේ මුළු ගමෙන්ම ලස්සනම.හැබැයි එයාගේ අම්මාගේ ජාන කැතිට නොගිය එක ගැන නම් ඇත්තටම මට පුදුමයි. ඒ වගේම එයාගේ තාත්තට හැම වාහනයක්ම එළවන්න පුළුවන්. එයා වාහන එළවනකොට මම නම් ඇස් පියා ගන්නවා. ඒ තරම් හයියෙන් වාහන එළවනවා. අපේ තාත්තට හොඳට ගහගන්න පුළුවන්. එයා යුද හමුදාවට ගියෙත්  ඒක නිසා කියලයි මටනම් හිතෙන්නේ. ඉතින් මම කැතිටයි ඇලෙන්ටයි දෙන්නටම මේ ආරංචිය කිව්වා. ඒ දෙන්නම සතුටු වුණා.

අපි දෙන්නා ඇලෙන්ව ගමේ ළමයින්ට හඳුන්වලා දුන්නා. ඇලනුත් අපිත් එක්ක සෙල්ලම් කරන්න ආවා. අපි හොඳට සෙල්ලම් කරලා විනෝද උනා.

ෆ්‍රෙඩී කියලා අපිට වැඩිය වැඩිමහල් අයිය කෙනෙක් අපේ ගමේ ඉන්නවා. එයා අපිත් එක්ක හැමදාම සෙල්ලම් කරන්න එනවා. එයා තමයි මුළු ගමේම සෙල්ලම් වලට දක්ෂම කෙනා. එයාගේ ඉස්කෝලේ ක්‍රීඩානායකයත් එයා. සෙල්ලම් කරලා හවස් වෙලා මම ගෙදර ආවා. අම්මයි මමයි තාත්තා එනකන් බලන් හිටියා.තාත්තා ආවේ කාර් එකේ. මම එයා දැකලා ගොඩක් සතුටු වුනා. අම්මත් සතුටු වුනා. අපිට රෑට කන්න අම්මා රසම රස කෑම එකක් උයලා තිබුණා.

මේ විදිහට දෙසැම්බර් මාසේ හොඳින් සහ සතුටින් ගෙවිලා ගියා. දැන් ආවේ නත්තල් සතිය මේ වෙනකොට හිම වැටිලා තිබුණා. ඇලනුයි,මායි,කැතියි අපේ ගෙවල් ලස්සනට සැරසුවා. ගමේ අනික් ළමයිනුත් අපිට එකතු උනා. මුළු ගමේ ම ළමයි එකතුවෙලා ගම ම සැරසුවා. ඇලන් අපිට එයා හිටපු කලින් ඉස්කෝලේ ගැනයි,අනාත නිවාසෙ ගැනයි කිව්වා.

"අපි හිටපු ළමා නිවාසේ අපි හරිම සතුටින් හිටියා.මට හිටපු යාළුවොත් හරි හොඳයි. එක දවසක් අපි ඔක්කොම එකතුවෙලා ළමා නිවාසයේ මිස්ට හොඳ වැඩක් කරා. ඒ මිස් හරිම නරකයි.එයා හරිම සැරයි. බනිනවා බනිනවා ඉවරයක් නෑ. එදා හොඳටම වැස්සා. ඒ මිස්ට කඩේ යන්න ඕනි කියලා කියනවා අපිට ඇහුණා. මමයි තව මගේ යාළුවෙකුයි එකතු වෙලා මිස් කඩේ යන්න අඳින ගමන් ඉන්නකොට වත්තට පැනලා වැස්සේ පණුවෝ එකතු කරලා. ඊට පස්සේ ඒ පණුවෝ මිස්ගේ කුඩේ ඇතුළට දැම්මා. මිස් කඩේ යන්න කුඩේ ඉහලද් දි ඔක්කොම පණුවෝ මිස්ගේ ඔලුවේ. ළමයි ඔක්කොටම හිනා...මිස් කෑගහගෙන බිම වැටුණා."

එයා ඒ කතාව කියපු විදිහට අපිටත් හිනා ගියා.

"ඉතින් මිස් දැන ගත්තේ නැද්ද ඔයාලා තමයි පණුවෝ දැම්මේ කියලා" කැති ඇහුවා.

"අපෝ නෑ! අපේ ළමයි හරි හොඳයි. ඒ නිසා අපි දෙන්නා පාවලා දුන්නේ නෑ. හැබැයි කරපු නරක වැඩේට ඔක්කොම ළමයි ගුටි කෑවා."

මේ විදිහට දවස් ගෙවිලා නත්තල උදාවෙන්න කලින් දවසේ අපි හැමෝම හරිම උද්යෝගයකින් හිටියේ. දෙසැම්බර් 24 අපි ඔක්කොම අලුත් ඇඳුම් ඇඳලා රස රස කෑම හැදුවා. අපේ අම්මා හදපු කෑම කන්න ගමේ ළමයි ගොඩක් ආවා .මමත් හරි සතුටෙන් හිටියා .කැතියි, ඇලනුයි දෙන්න එදා හවස් වෙද්දි අපේ ගෙදරටආවා .අපි නත්තල හින්දා හිටියේ හරි සතුටින් .ඊට පස්සේ අපි තුන්දෙනාම මගේ කාමරයට ගියා.

"මේ සැරේ අපි නත්තල් සීයාගෙන් මොනවද ඉල්ලන්නේ?" ඇලන් ඇහුවා.

"මම ඉල්ලනවා අලුත් පැන්සල් පෙට්ටියක්" මම කිව්වා

"මම ඉල්ලනවා අලුත් සපත්තු දෙකක් "කැතී කිව්වා.

"මම ඉල්ලනවා අලුත් ස්කුල් බෑගයක්. ඒ වගේම තමයි මම ඔයාලා යන ඉස්කෝලෙටම දානවා කියලා අම්මා මට කිව්වා" ඇලන් අපිට කිව්වා.

"හරිම ෂෝක් !අපි ඔයාව යාළුවොන්ට හඳුන්වලා දෙන්නම්. ඒක නෙමෙයි මේ සැරේ නත්තල් සීයගෙන් අපි වෙනම විදිහේ තෑග්ගක් අපි ඉල්ලමුද ?"මම යෝජනා කරා.

"ඒ කිව්වේ මට නම් තේරෙන්නෑ !" කැති  කිව්වා.

"මං අහලා තියෙනවා නත්තල් සීයාට අපේ හිතේ තියෙන දේවල් තේරෙනවා කියලා .අපි නත්තල් සීයාගෙන් ඉල්ලමු එක එක විදිහේ බලයන්.!"

"බලයන් !" කැතියි, ඇලනුයි දෙන්නම එක පාරට කිව්වා.

"ඔව් අනේ බලයන් .අපි අර ඉල්ලන දේවල් ලියුමක ලියලා අපි ඉල්ලන බලය හිතේ තියාගමු .මමත් නම් හිතන්නේ නෑ මේක හරියයි කියලා. ඒත් ඉතින් උත්සාහ කරන එක හොඳයි නේ... මේක කරොත් අපිට දැනගන්න පුළුවන් ඔය නත්තල් සීයා කියන්නේ ඇත්තක්ද බොරුවක්ද කියලා"

" අයියෝ රීටා, පොඩි එකෙක් වෙන්න හදන්න එපා. නත්තල් සීයා කියන්නේ මනඃකල්පිත දෙයක් විතරයි. "කැතී කිව්වා.

"අනේ මං කියනවට විතරක්.. ප්ලීස්... අනේ කැති අනේ ඇලන් .."

"දැන් ඕක කරන්න ඇයි ඔයා අපිට අඬගහන්නේ?" ඇලන් ඇහුවා.

"අයියෝ.. තේරෙන්නේ නැද්ද? යාළුවොත් එක්ක මේ වැඩ කලාම තමයි ගැම්මක් තියෙන්නේ. මේක හරියයි කියලා විශ්වාසයක් මටත් නෑ. ඒ උනාට කරලා බලමුකෝ.."

"හරි හරි ඔච්චර කියනවනම් අපිත් කරමුකෝ" අන්තිමේදී ඇලන් කිව්වා.

"මම නත්තල් සීයාගෙන් ඉල්ලනවා මිනිසුන්ගේ හිත් කියවන්න පුළුවන් බලයක්." මම කිව්වා.

"මම ඉල්ලනවා සත්තුත් එක්ක කතා කරන්න බලයක්. එතකොට මට මගේ බල්ලත් එක්කත් කතා කරන්න පුළුවන්නේ." කැතී කිව්වා.

"මම ඉල්ලනවා ගස් පාලනය කරන්න බලයක්" ඇලන් කිව්වා.

"නියමයි!. එහෙනම් අපි අද රෑට හිතින් ප්‍රාර්ථනා කරමු" මම කිව්වා."

"අයියෝ මට නම් ඕක ගැන කිසිම විශ්වාසයක් නෑ. පොඩි ළමයිවත් මේ විදිහේ පිස්සු වැඩ කරන්නේ නැතුව ඇති " කැතී කියන්න පටන් ගත්තා.

"ඒයි ..ඔහොම කතා කරන එක නවත්තන්න. අද නත්තල් දවස "ඇලන් කිව්වා.

ඊට පස්සේ ඒ දෙන්නම එයාලාගේ ගෙවල් වලට ගියා. අපි ඔක්කොම එකතුවෙලා නත්තල හොඳට සමරුවා. මම ඉල්ලපු පැන්සල් පෙට්ටිය ගැන ලියලා ගහ යටින් තිබ්බා. මං ඉල්ලපු බලය මට ලැබෙන්න කියලා හිතලා මම නිදාගත්තේ පොඩි බලාපොරොත්තුවක් හිතේ තියාගෙන.

***

පහුවදා උදේ නැගිටලා මම මුලින්ම දිව්වේ නත්තල් ගහ ලඟට. මම ඉල්ලපු පැන්සල් පෙට්ටිය එතන තිබුණා. ඊළඟට මේ බැලුවේ මං ප්‍රාර්ථනා කරපු බලය මට ලැබිලාද කියලා. ඊට පස්සේ මම කුස්සියට ගියා. ඒ අම්මාගේ හිත මට කියවන්න පුලුවන් ද කියල බලන්න. ඒත් මට එහෙම කරන්න බැරි වුණා. අම්මා මගේ දිහා පුදුමෙන් බලාගෙන හිටියා. අම්මා මං දිහා බලන් ඉන්න විදිහ දැකලා මං මගේ උත්සාහය නැවැත්තුවා.

"ඇයි රීටා , ඔයාට නත්තලට හම්බවුණ තෑග්ග එච්චර හොඳ නැද්ද ?"

"නෑ අම්මා, ඒක ගොඩක් ලස්සනයි. ඔයාට ස්තුති කරන්න කියලා මං ආවේ."

"එහෙනම් ඇයි අවුලෙන් ඉන්නේ?"

"නෑ , එහෙම මුකුත් නෑ"

එහෙම කියලා මම එළියට ගියා. කැතී කියපු දේ හරි. මම පොඩි ළමයෙක් වගේ නත්තල් සීයා විශ්වාස කරා.ඒත් කමක් නෑ,කොහොමත්ම මේ ප්‍රාර්ථනාව සාර්ථක වෙයි කියලා මම හිතුවේ නැහැනේ. මෙහෙම හිතලා මම මගේ හිත සනසා ගත්තා. ඊට පස්සේ මම ආපහු මගේ කාමරයට ගිහිල්ලා හිම වැටෙන හැටි බලාගෙන හිටියා. ඒත් එක්කම මම දැක්කා ඇලන් අපේ ගෙදර ළඟට බයිසිකලින් එනවා .එයා සතුටින් වගේ කියලයි මට හිතුනේ. මම එයාව පිළිගන්න දොර ළඟට ගියා. එයා කලබලෙන් වගේ හිටියේ.

"රීටා , රීටා.. මේ බලන්නකෝ ඔයාගේ නත්තල් සීයගෙ කතාව හරියටම හරි!මේ මට ගස් පාලනය කරන්න පුළුවන්. ඔයාගේ බලෙත් ලැබුණද? "

"මොකක්! බලේ ලැබුනද? ඒ වුනාට මට ලැබිලා නෑනේ.හරි පුදුමයි .මට මකුත් තේරෙන්නෑ. මම අද අම්මා ළඟට ගිහින් කරලා බැලුවා. ඒත් හරිගියේ නෑ."

"මට කරලා බලන්න" ඇලන් කිව්වා.

මම ටිකක් උත්සාහ කරලා බැලුවා.

"හරි යන්නේ නෑ මං හිතන්නේ මට බලය ලැබිලා නෑ. "

"ඒක වෙන්න බෑ .මේ බලන්නකෝ "

එහෙම කියලා එයා බිම හිමෙන් වැහිලා තිබුණු තණකොළ ගහක් දිහා බලාගෙන හිටියා. පුදුමෙනුත් පුදුම වෙන්න ඒ ගහ කොළ පාට වුණා!

"දැක්කද? මේ වගේ ගොඩක් දේවල් කරන්න පුළුවන්. කැතීටත් එයාගේ බලය ලැබිලද දන්නේ නැහැ. ගිහින් බලමුද? "

"හා ගිහින් බලමු"

අපි කැතීගේ ගෙදරට ආවා. ඊට පස්සේ එයාව හම්බ  හම්බවුණා. මට නම් හරිම පුදුමයි. කැතීටත් ඒ බලය හම්බවෙලා තිබුණා.

"මට හරිම පුදුමයි. ඔය දෙන්නටම බලය ඇවිල්ලා. කැතීට එයාගේ බල්ලා කියන දේ තේරෙනවා. එයාගේ බල්ලටත් කැතී  කියන දේ තේරෙනවා. ඔයාට ගස් පාලනය කරන්නත් පුළුවන්. එහෙනම් මට ඇයි ඒ බලය ලැබුණේ නැත්තේ?"

"රීටා අපි චුට්ටක් ඉවසමු. සමහරවිට ඔයාගේ බලය ලැබෙන්න පරක්කු වෙනවද දන්නේ නැනේ?  කැතී  කිව්වා.

"ඔව් අපි චුට්ටක් ඉවසලා බලමු." ඇලනුත් කිව්වා.

අපි ගමේ හිටපු ළමයි එක්ක හිම බෝල සෙල්ලම් කරද්දි මම  එයාලගේ හිත් කියවන්න බැලුවත් හැබැයි හරි ගියේ නෑ. මට නම් මේක ලොකු ප්‍රශ්නයක් වුණා. ඒත් අර දෙන්නා කියපු විදිහට මට හිතුනා ඉවසන එක තමයි හොඳම කියලා.

## ඉස්කෝලෙට ඇලන් එක්ක

සති දෙකක් තුනක් ගත වුණත් මගේ බලය මට ලැබුණේ නෑ. ඒ ගැන මට පොඩි දුකක් නැත්තේමත් නෑ. ඒ වගේම මට ඇලන් ගැනයි කැතී ගැනයි ඊරිසියයි. හැබැයි ඒ දෙන්නම තරහක් කරගන්න ඕනෑ නැති නිසා මම ඒක පෙන්නන්න ගියේ නෑ .ඒ දෙන්නත් ඒ දෙන්නගෙ බලය මට වැඩිය පෙන්න පෙන්න හිටියේ නෑ. ඒ මට දුක හිතෙන නිසා වෙන්න ඇති. ඒත් නත්තල් සීයා මට විතරක් ඇයි මෙහෙම කළේ.? අර තෑගි නත්තල් සීයගෙන් ඉල්ලුවාට අපිට දුන්නේ අම්මලා කියලා අපි දන්නවා. ඒත් මේ වගේ සුපිරි බලයන් අම්මලාට දෙන්න බැහැනේ. එතකොට නත්තල් සීයා කියලා කෙනෙක් ඇත්තටම ඉන්නවනම් ඇයි එයා ළමයින්ට වෙනස්කම් කරන්නේ ? මට නම් තේරෙන්නේ නෑ.

දෙසැම්බර් මාසේ මේ විදිහට ගතවෙලා ගියා. කොහොම වුණත් ඇලනුයි කැතීයි මේ අමුතු බලයන් ගැන අම්මලාට කිව්වේ නෑ. එයාලා මේක අපි තුන්දෙනා අතර විතරක් තියාගන්න තීරණය කරා. එක අතකට එක හොඳ තීරණයක් කියලා මට හිතුණා .මොකද අම්මලාට ඕවා තේරුම් කරන්න බෑ. අනික බැරි වෙලාවත්

අම්මලා ඒ දෙන්නව දොස්තර කෙනෙක් ළඟට අරන් ගියොත් !ඒක නිසා අම්මලාට නොකියා ඉන්න එක හොඳයි කියලා තීරණය කරා .

අපේ ගෙදර ඉඳලා ඉස්කෝලෙට වැඩිදුරක් නෑ. හැබැයි අපේ ඉස්කෝලේ තියෙන්නේ අපේ ගමේ නෙවෙයි. අල්ලපු නගරයේ. නත්තල ඉවර වෙලා හිම වැටෙන කාලයත් ඉවර වුනාම වසන්ත කාලයේදී අපේ ඉස්කෝලේ ආපහු පටන් ගත්තා. නිවාඩුව ඉවර වෙන දවසේ ගමේ හැමෝගෙම ගෙවල් කලබලෙන් පිරිලා ගියා.

"රීටා ඉස්කෝලෙ යන්න බෑග් එක හදාගත්තද?"

"ඔව් අම්මා ,සාලෙන් හදලා තිබ්බා. මම යුනිෆෝම් එකත් අයන් කරගත්තා."

"සපත්තු දෙක?"

"පොලිෂ් කරගත්තා අම්මේ"

සුපුරුදු පරිදිම මේ දවසේත් මාසයකට පස්සේ පොත් ටික බැලුවේ අද. කාලා, සෙල්ලම් කරලා, නිදාගත්ත එක කරා මිසක් පොතක් බැලුවේවත් නැහැනේ. ඒ පොත් දැක්කම තමයි මතක් උනේ අපිට ඉංග්‍රීසි මැඩම් නිවාඩු කාලේ ලියාගෙන ඉන්න රචනා පහක් දීල කියලා! දැන් මේ රෑ ඒක කොහොම ද කරන්නේ? අනිත් මැඩම්ලා නං වැඩිය පොත් බලන්නේ නැති නිසා මොනවා හරි කරන්න පුළුවන්. මේ විදියට කල්පනා කර කර ඉන්නකොට තමයි මට මේක කොහොමද කරන්නේ කියලා තේරුනේ. මම අම්මගෙන් ෆෝන් එක ඉල්ලගෙන ළමයෙක් කියපු රචනා ටිකක් ගූගල් එකෙන් තෝරා ගත්තා. ඊට පස්සේ ඒ ඔක්කොම එකතු කරලා ප්‍රින්ට් අවුට් එකක් ගත්තා. හවස් වරුවක නිසා කඩේ වහලා තිබුණේ නෑ. ඊට පස්සේ ඔක්කොම පොතේ අලව ගත්තා. ඒ ටික නිකං මම ලිව්වා වගේ ලස්සනට තිබුණා. හැබැයි මේ වැඩේ අහිතකර ප්‍රතිඵල මට ලැබුණේ නොහිතපු වෙලාවක.

***

මම හොඳට ලෑස්ති වෙලා ඔක්කොම කරගෙන හිටියා. ලෑස්ති වෙලා ඉවර වුන ගමන් එළියට බහිද්දිම ඇලනුයි කැතීයි දෙන්නම ගෙදර ගේට්ටුව ළඟ හිටියා. ඇලන් එයාගේ බලය පාවිච්චි කරලා සීතල හොඳ හුළඟක් එව්වා එව්වා.

"ගුඩ් මෝර්නින්ග් දොයිය බබා."

"කැතී ..මට ඔහොම කියන එක නවත්තන්න. කටුස්සා"

"ආ ..මේ ,අද මං අලුත් ඉස්කෝලෙට යන පළවෙනි දවස .උදේම දවස කන්න ද යන්නෙ ?"

"අපි කොහොමත් හැමදාම කරන්නේ වැඩ අනාගන්න එකනේ ඒක නිසා ගනන් ගන්න එපා."

ඊට පස්සේ අපි ඔක්කොම බයිසිකලේ පැදගෙන ගියා.

"ඒක නෙවෙයි රීටා, මම ඊයෙ රෑ තමයි පොත් ටික බැලුවේ .මම ඊයෙනෙ දැක්කේ අර ඉංග්‍රීසි රචනා පහ. ඔයා ඒවා ලිව්වද?"

"නෑ.. මං ලිව්වෙත් නෑ .මමත් ඒ ටික දැක්කේ ඊයේ .මම මේවා ෆෝන් එකෙන් අරගෙන ෆොටෝකොපි කරා."

"ඒයි රීටා.. මමත් ඒකමයි කරේ"

"ඔයාගේ ෆොටෝ කොපි ටික පෙන්නන්න "මම කිව්වේ බයිසිකලේ නතර කරන ගමන්.

"මේ තියෙන්නේ"

කැතී මට ඒ ටික දුන්නා. ඒ පහම මං ෆොටෝ කොපි ගහපු පහටම සමානයි කියලා මම දැක්කා.

"අයියෝ කැතී, අපි දෙන්නම එකම එක කරලා තියෙන්නේ..අහු උනොත් එහෙම ඉවරයි "

"දැන් මොකද කරන්නේ?"

"ඔය දෙන්නට බේරෙන්න එක ක්‍රමයක් තියෙනවා තියෙනවා". ඇලන් කිව්වා. "කැතී ඔයා ඔයාගේ බලය පාවිච්චි කරලා පන්තියට මොකෙක් හරි සතෙක් ගෙන්න ගන්න. හරියටම මැඩම් පොත් බලන්න පටන් ගත්ත ගමන්. එතකොට ඔක්කොම හරි."

"හොඳ අදහස් ඇලන් එහෙනම් අපි එහෙම කරමු."

"බලනකොට ඔයාලගේ බලයන් වලින් ප්‍රයෝජන ගොඩක් තියෙනවා. "

මම එහෙම කිව්වත් මගේ හිතේ ගොඩක් ලොකු කලකිරීමක් තිබුණා .මොකද මගේ අදහසින් මට මුකුත් ලැබුණේ නැති නිසා.

අපි ඉස්කෝලෙට ඇවිල්ලා ඇලන්ට හැමදේම පෙන්නුවා. ඇලන්ව යහළුවන්ටත් හඳුන්වලා දුන්නා. ඇලනුත් ගොඩක් සතුටු වුනා.

ඊට පස්සේ ඉස්කෝලේ පටන් ගත්තා .අපේ පන්තියේ පන්තිභාර ගුරුතුමිය ඇලන්ව පන්තියේ අනිත් ළමයින්ටත් හඳුන්වලා දුන්නා. අපේ පන්තියට ගුරුතුමිය එන්න කලින් කැති ගැරඬියෙකුට කතා කරලා තිබුනා. ගැරඬියා කියන්නේ අහිංසක සතෙක් උනාට ළමයි කලබල වෙන නිසා කැතී ඒ සර්පයාට කතා කරලා තිබුණා. මැඩම් පොත් බලන්න පටන් ගත්තා. එතකොට අතන දොර ළඟ හිටපු ගැරඬියා ඇතුලට ඇවිත් ළඟම හිටපු ළමයගේ කකුල ළඟින් ගියා. එතකොට ඒ ළමයා සර්පයාව දැක්කා. ඒ ළමයා කෑ ගහගෙන අහකට පැන්නා. ගුරුතුමියත් බය වුණා. ඔක්කොලාම කෑ ගැහුවා. ඩෙස් පුටුවලත් නැග්ගා. අපි තුන් දෙනා බයවෙලා වගේ රඟ පෑවා. ඒ උනාට කැතී නම් හිනාව නවත්ත ගත්තෙත් පුදුම අමාරුවකින්.

හැබැයි මේකත් එක්ක මට හිතුනා ගුරුතුමියගේ හිත කියවලා බලන්න. මට ඒ බලය නැහැ තමයි ඒත් මේ දෙන්නාටම බලය තියෙන නිසා එහෙම එක සැරයක් උත්සාහ කරල බලන්න හිතුනා. මම මිස් දිහා බලාගෙන හිටියා "මේ සර්පයා කොහෙන්ද මෙහාට ආවේ.." මෙහෙම මිස් හිතනවා කියලා මට දැනුනා. මිස් ගොඩක් බය වෙලා කියලත් දැනුනා මට පුදුමයි! මට ඒක දැනුනා.! ඒ කියන්නේ මටත් බලය ඇවිල්ලාද? මට තව ළමයෙකුගේ හිත කියවලා බලන්න හිතුනා. ඒත් පන්තියේ ළමයි හැමෝටම දැනෙනවා ඇත්තේ මැඩම්ගේ අදහස කියලා මට

හිතුණා.ඊට පස්සේ මම ඈත යන ළමයෙක්ව ජනේලයෙන් දැක්කා. මම ඒ ළමයා දිහා බලාගෙන හිටියා. " මගේ ආදරය ! අනේ මට එයත් එක්ක දිගටම ඉන්න ඕනේ... මේ හැඟීම මට එයාට කියන්න පුළුවන් නම්...."ඒකෙන් පස්සේ මම ආයෙ එයා දිහා බැලුවේ නෑ. මොකද මම පෞද්ගලික ජීවිතවලට ඇඟිලි ගහනවා කියලා මට හිතුන නිසා. ඊට පස්සේ මගේ බලේ හොඳකට විතරක් පාවිච්චි කරන්න මං හිතාගත්තා.

කැතිටයි ඇලන්ටයි මේ කතාව කියන්නත් මම හිටියේ ඉවසිල්ලක් නැතුව. ඒ වගේම අර ගැරඩියා නිසා සමහර ළමයි පන්තියේන් එළියට දිව්වා. කොහොම හරි මුළු කාලච්ඡේදයක්ම අර ගැරඩියා පන්තියම කලබල කරා.ඒක නිසා අපි දෙන්නා බේරුනා. දෙවෙනි කාලච්ඡේදය පටන් ගන්න කලින් මම අර දෙන්නට මට බලය ලැබුණා කියලා කිව්වා.

"එහෙනම් මං හිතාගෙන ඉන්න එක මට කියන්න ඇලන් කිව්වා.

ඒත් මට එයාගෙ හිත කියවන්න බැරි වුණා. ඒත් අනිත් අයගේ හිත කියවන්න පුළුවන්. මේ ගැන මම ඒ දෙන්නට කිව්වා.

"සමහර විට අපි දෙන්නටත් බල තියෙන නිසා වෙන්න ඇති" අන්තිමේදී කැති කිව්වා.

"හරි අපි දෙන්නාගේ හිත කියවන්න බැරිනම් අන්න අර ළමයගේ හිත කියවන්න බලන්න"

ඇලන් ජනේලෙන් එහා පැත්තේ හිටපු වෙන ළමයෙක්ව පෙන්නුවා.

"අයියෝ බෑ. මම කලින් අර ගියපු ළමයගේ හිත කියවලා උන වැඩේ දන්නවනේ. ඒක නිසා ආය නම් මට ඕනි කියලා හිතෙන ළමයගේ හිත විතරයි මම කියවන්නේ . මොකද නැත්නම් අනුන්ගේ පෞද්ගලික ජීවිත වලට මට ඇඟිලි ගහන්නවා වෙන්න පුළුවන්."

ඊට පස්සේ කැති විවේක වෙලාවෙදි අර ගැරඩියාට ස්තුති කරා. ඉස්කෝලෙන් ගෙදර යද්දී ඇලන් අපෙන් මෙහෙම ඇහුවා.

"රීටා මොකක්ද අර උස බිල්ඩිම?"

"ඒ හොස්ටල් එක "

" අපි ඒකට ගිහින් බලමු. මම ඉස්කෝලේ ඇවිද්දට ඒ බිල්ඩිමට ගියේ නෑ නේ. "

"අපොයි ඒකට අපිට යන්න බෑ.තහනම්. ඒක තියෙන්නේ....."

කැති කියලා ඉවර වෙන්නත් කලින් ඇලන් කතා කරා .

"මම දන්නවා.ඒක තියෙන්නේ දුර ඉන්න ළමයිටනේ. මම කලින්ම ඉස්කෝලෙකට ගිහින් තියෙනවා. මම ඔයාලාට කියන්න හැදුවේ අපි හොරෙන් ගිහිල්ලා බලමුද කියලා."

"ඔයාට පිස්සුද?අපිට බලයන් තියෙන්නේ මේ වගේ වැඩ කරන්න නෙවෙයි. හොඳ දේකට පාවිච්චි කරන්න. ඒක නිසා ඔය වැඩේ නම් කරන්න එපා."මම කිව්වා.

"අනේ රීටා...අපි කරන්නේ නරක දෙයක් නෙවෙයි. අනික අපි සාමාන්‍ය ළමයිනුත් නෙවෙයි. අපි මේ බල පාවිච්චි කරලා දඟ වැඩක් කරේ නැත්නම් හරියන්නේ නෑ. අනේ ප්ලීස්..."

"හරි එහෙනම් යමුකෝ. ඒ උනාට මම නම් ඔය වැඩේට කැමති නෑ.." කැති කිව්වා.

ඊට පස්සේ අපි හොස්ටල් එක පැත්තට ගියා. යන අතරමග අපිට අර ගැරඬියාව හම්බවුණා. ඊට පස්සේ කැතියි,ඒ සර්පයයි මූණට මුහුණු බලාගෙන මොනවාදෝ කියවන්න පටන් ගත්තා. ඊට පස්සේ කැති අපි දිහාට හැරිලා මෙහෙම කිව්වා.

"අපිට හොස්ටල් එක බලන්න මේ සතා උදව් කරයි. ළමයිනුයි මිස්ලයි ඔක්කොම මේ සතා එලවලා දායි. මෙයා තව සර්පයෝ ටිකකට අඬගහන්නම් කියලා කිව්වා "

ඊට පස්සේ සර්පයෝ හොස්ටල් එක ඇතුලට ගියා. එකපාරටම මෙච්චර සත්තු ගොඩක් ආවේ කොහොමද කියලා මිස්ලත් පුදුම උනා. සමහර ළමයි එලියට දිව්වා . සමහරු කෑගැහුවා. උඩ තට්ටුවේ හිටපු හැම ළමයෙක්ම පහලට බැහැලා එළියට දිව්වා . ඒ විදිහට බලපුවාම අපේ මේ බලයන් නිසා අපිට ගොඩක්

ප්‍රයෝජන තියෙනවා.ළමයි බඩුත් පෙරලගෙන පහළට දුවපු නිසා කවුරු උඩ පේන්න හිටියේ නෑ. මේ විදිහට හොස්ටල් එක බල බල ඉඳී කැති මෙහෙම කිව්වා.

"සත්තු ටික අරගොල්ලන්ව එලෙව්වේ පල්ලෙහාටනේ. අපි හොස්ට් එක බැලුවනේ දැන් කොහොමද පල්ලෙහාට යන්නේ? "

"මෙහෙම" කියලා ඇලන් පඩිපෙළ බහින්න පටන් ගත්තා.

"අයියෝ ඔච්චර මෝඩ වෙන්න එපා ඇලන්. දැන් අපි පල්ලෙහාට බැස්සොත් එළියේ ඉන්න අයට අපිව අහුවෙනවා. අනික ජනේලේ ළඟට යන්න එපා. පල්ලෙහා අය දැක්කොත් ඔක්කොම ඉවරයි."

"ඔව් තමයි පල්ලෙහා කට්ටිය ඉන්නවා කියලා මට අමතක උනා."

"හරි දැන් තියෙන  ලොකුම ප්‍රශ්නය තමයි කොහොමද මෙතනින් එළියට යන්නේ කියන එක. අනික සත්තු ටික ඔක්කොම අරගොල්ලන්ව එලියට

එලෙව්වෙන් පස්සේ සත්තු ටික ඔක්කොම යයි.  එතකොට ආපහු අරගොල්ලෝ ඇතුලට එන්න පටන් ගනියි."

"එක ක්‍රමයක් නම් තියෙනවා. මගේ පස්සෙන් එන්නකෝ. "

ඊට පස්සේ ඇලෙන් පිටිපස්සෙන් අපි ගියා. ඇලන් ගියේ බිල්ඩිමේ අනිත් පැත්තට.ගිහිල්ලා එතන ජනේලේ  ළඟ හිටගෙන හිටියා. එක පාරටම ලොකු ඕක් ගහක අත්තක් ජනේලේ ළඟට ආවා ඇලන් ඒ අතතේ එල්ලුණා.

"ඔයාලත් මේ අත්තේ එල්ලෙන්න."

"කවුරු හරි අපිව දැක්කොත්?"

" අසුභවාදීව කතා කර කර කාලය කන්නේ  නැතුව ඉක්මනට එන්න කැති. "

ඊට පස්සේ මමයි කැති දෙන්නත් අත්තේ එල්ලුනා.

" පල්ලෙහානම් බලන්න එපා. " ඇලන් කිව්වා .

කොහොම හරි අපි පරිස්සමෙන් බිමට බැස්සා.

"අපි තව අද දවසක මේක ඇතුළට යමු. හරි විනෝදයි නේ."ඇලන් කිව්වා.

මෙයාට නම් මුකුත් තේරුම් කරලා දෙන්න පුළුවන් ළමයෙක් නම් නෙවෙයි. "මම කිව්වා.

"අනේ මේ... ඔය මදෑ දැන්වත් යමු ගෙදර."

මේ වෙනකොට හොස්ටල්

එකේ ළමයි හොස්ටල් එකට ගිහිල්ලා තිබුණා. ඊට පස්සේ අපි හැමෝම ගෙදර ගියා.

විභාගය

ඊළඟ දවසේ ඉස්කෝලේ ආවම අපි තුන්දෙනාට හිනාව නවත්තගන්න හරිම අමාරු උනා. මොකද ඉස්කෝලේ හැම මැඩම් කෙනෙක්මයි ළමයෙක්මයි කතා කරේ හොස්ටල් එක ගැන.

හැබැයි උදේ නිවේදන අහපුවාම තමයි මටයි කැත්ටයි දෙන්නටම මතක් උනේ හෙට අපිට වාර ඇගයීමක් තියෙනවා කියලා. මේවා අපේ ලකුණු පොතට දාන්නේ නෑ. මොකද වාර අවසාන ඒවා නොවන නිසා. ඒ උනාට ලකුණු අඩු ළමයින්ට ඉස්කෝලේ ඇරිලා හවස් වෙනකම්ම ඉන්න වෙනවා. ඒ වුණාට මොකක්දෝ වාසනාවකට කැතීයි මමයි දෙන්නම කවදාවත් හවස ඉඳලා නෑ. මේ ඇගයීමෙන් මට හවස ඉන්න ඕනෑකමක් තිබුනෙත් නෑ. හැම වාර ඇගයීමකදීම

අපිට මේ දේ වෙනවා. අපිට අද දවසම පාඩම් කරන්න වෙනවා.හැම වාරයකම අපි කළේ එහෙම ඒක නිසා මේ නිවේදනය අහලා අපි වැඩිය පුදුම වුණේ නෑ.

ඒ උනාට මොකක්දෝ හේතුවකට මට පන්තියේ පළවෙනියගේ හිත කියවන්න හිතුනා. එතකොට මට දැනගන්න පුළුවන් වුණා එයා ෆයිල් එකක් දාගෙන ඊට පස්සේ හෙට විභාගය ලියනවා කියලා. එතකොට තමයි මටත් තේරෙන්නේ මෙයා හැම සැරේම පන්තියේ පළවෙනියා වුනේ කොහොමද කියලා? ඊට පස්සේ බයිසිකලේ ගෙදර යන ගමන් මම මේ ගැන ඇලන්ටයි කැතිටයි කිව්වා. ඊට පස්සේ කැති මෙහෙම කිව්වා.

"අපි හෙට ඒ ළමයව අල්ලගන්න ඕන. කොහොම හරි."

"ඒත් කොහොමද?"මම ඇහුවා.

"විභාගය ලියන වෙලාවේදී මම ගෙම්බෙක්ට කතා කරලා එයාගේ කොලේ ගන්න කියන්නම්. එතකොට එයාට හරියට පේපරය ලියන්න වෙන්නේ නෑ."

"හොඳ අදහස" මමත් කිව්වා.

"ඒක නෙවෙයි ඔය විභාගෙ ගොඩක් අමාරුද?" ඇලන් ඇහුවා.

"මේ විභාගෙට වැඩිය පාඩම් කරන්න ඕන නෑ. බයවෙන දෙයක් නෑ. කොහොමත් අපි දෙන්නා හැමදාම ගියේ එහෙමනේ.. නේද රීටා "

"ඔව් ඔව් " මමත් කිව්වා.

" ඒ රීටා, මට ඔයාගෙන් අහන්නත් බැරි උනා. ඔයා ඔයාගේ අම්මාගේ හිත කියෙව්වද? " කැති ඇහුවා.

"ඔව් මම කරන්න බැලුවා. ඒ උනාට බැරි වුනා.මං හිතන්නේ මේ ගමේ කිසි කෙනෙක්ගේ හිතක් මට කියවන්න බෑ. ඒත් ගමෙන් පිට අයගේ හිත් කියවන්න පුළුවන්."

" ඒක වෙන්න විදිහක් නෑ. මොකද එහෙනම් අපිටත් විදිහට වෙන්න ඕනනේ. ඒ වුනාට ඇලන්ට මේ ගමේ ගස් පාලනය කරන්නත් පුළුවන්. මට ගමේ සත්තු පාලනය කරන්නත් පුළුවන්.

මට හිතෙන විදිහට මෙතන මොකක් හරි ප්‍රශ්නයක් තියෙනවා. "

ඊට පස්සේ ඇලෙන් කැතිගේ මූණ දිහා පුදුමෙන් බලාගෙන හිටියා.

"ඇයි මොකද මගේ මූණ දිහා බලන් ඉන්නේ?"

"කැති ඔයාගේ අල්ලේ පිට පැත්තේ තියෙන්නේ ලොම් වගේ දෙයක් නේද?"

මමත් ඒක දැක්කා.ඒ සතුන්ගේ ලොම් තමයි කියලා මට හිතුනා.

ඒ වගේම රීටා,ඔයාගේ කොණ්ඩේ තිබුණට වඩා දික් වෙලා නේද? "

මගේ කොණ්ඩේ තිබුනට වඩා ගොඩක් දික්වෙලා කියලා මමත් දැක්කා. ඇත්තටම මම කොණ්ඩවලට වැඩිය කැමති කෙනෙක් නෙවෙයි. මගේ කොන්ඩේ කන ළඟට විතරක් තියෙන විදිහට මම කපලා තිබ්බේ ඒකයි. ඒත් දැන් මගේ කොන්ඩේ උරහිස ළඟට යනකන් දික් වෙලා! ඒක එකපාරටම දික්වුනේ කොහොමද කියලා මටත් පුදුමයි. ඒ වගේම කැතී ගේ අල්ලේ අනිත් පැත්තේ ලොම් වැවිලා තිබුණා.ඇලන් දැක්කේ නැති උනත් ඇලන්ගේ කකුල උඩ මොනවදෝ තිබුනා. හරියට පණුවෝ වගේ.

"ඇලන් ඔයාගේ කකුලේ මොනවදෝ තියෙනවා." මම කිව්වා.

ඇලනුත් ඒක දිහා බලලා පුදුම උනා. ඒක අතගාලා එයා ඒක කඩලා දැම්මා.

"ඒ පණුවෙක් නෙවෙයි.ඒක ගසක මුලක් "

"මට හිතෙන්නේ අපිට ලැබුණු බල නියෝජනය වෙන විදිහට තමයි අපේ මේ මතුපිට පෙනුම වෙනස් වෙන්නේ" කැති කිව්වා.

"අපි නත්තල් සීයගෙන් නම් මෙහෙම දෙයක් ඉල්ලුවේ නෑ කියලා මට සියට සීයක් විශ්වාසයි. "ඇලන් කිව්වා.

" අපි දැන් ඉක්මනට ගෙදර යමු. ඔයාට නම් මුල් අයින් කරන්න ලේසියි. මම ශේව් කරන්න ඕනනේ. අනික රීටා කොණ්ඩේ කපන්නත් ඕනේ."

"හරි අපි යමු."

දවල් වෙලා ගෙදර ගිය ගමන්ම මම කරේ නාන කාමරයට රිංග ගන්න එක. හැබැයි මම මතක ඇතුවම කතුරක් ගෙනිච්චා. ඊට පස්සේ ගානට කොන්ඩේ කපා ගත්තා. ඒ වැඩේ ටිකක් වෙලා ගියා. ඒ හින්දා හරිය නා ගන්න ලැබුනෙත් නෑ.

ඊට පස්සේ අම්මා එළියේ ඉඳගෙන මට කෑ ගැහුවා. "ඕකේ පැල වෙලාද? මොනවද කරන්නේ?" අම්මාගේ කටහඬ ඇහිලා මම ඉක්මනට නාන කාමරයෙන් එළියට ආවා.

හෙට තියෙන විභාගය නිසා මම මේවා නවත්තලා පාඩම් කරන්න පටන් ගත්තා.විනාඩි ඉතිහක් විතර පාඩම් කරද්දී මට කම්මැලි හිතුණා. ඊට පස්සේ මම වෙන පොතක් කියෙව්වා. රෑ වෙලා ආයෙ පාඩම් කරන්න ගත්තා. ඒ උනාට මට එහෙමම නින්ද ගියා. මාව ආයෙ නැගිට්ටුනේ කවුරුහරි මට කිචි කවනවා වගේ කියලා දැනිච්ච නිසා. නැගිට්ටයින් පස්සේ තමයි මම දැක්කේ. මගේ කොන්ඩේ ආපහු උරහිස ළඟටම දික් වෙලා. ඒ වගේම මගේ අත්වලයි කකුල් වෙලයි නුත් කෙස් වැවිලා තිබුණා. මූනෙත් තිබුනා.ඇත්තටම නත්තල් සීයා දුන්නේ බලයක්ද, වදයක්ද කියලා මට නම් තේරුනේ නෑ. ඊට පස්සේ ආයේ නාන කාමරයට ගිහිල්ලා ඔක්කොම සුද්ද කරගෙන ආවා. ඊළඟ දවසේ අම්මා කාමරයට එන්න කලින් මම නැගිට්ටා. මොකද ආවොත් ගෝරිල්ලෙක් වගේ ඉන්න මාව අහුවෙන නිසා. මම යුනිෆෝම් එක ඇඳලා ඒකට උඩින් අත් දිග ජර්සියක් දාගත්තා.

" ඇයි මේ අත් දිග ජර්සි දාගෙන? "අම්මා ඇහුවා.

"අම්මේ මට මේ පොඩ්ඩක් සීතලයි වගේ "

"එහෙමද ඒ උනාට සීතල කාලේ පහු උනානේ. හරි කමක් නෑ. මේ වයසට ස්ටයිල් දාන්නත් පටන් ගත්තද?"

"අනේ නෑ අම්මා. මම තාම පොඩි ළමයා "

අම්මා ඒ විදිහට මං ගැන හිතපු එක ගැන නම් මට දුක හිතුනා. මොකද මම කවදාවත් එහෙම හිතලා නෙවෙයි ජර්සිය දැම්මේ. ඒ උනාට අම්මා අද ජර්සිය ගලවන්න කියලා කිව්වෙ නැති එකට මම ගොඩක් සතුටු උනා. ගෙදරින් එළියට යද්දි තමයි මමත් දැක්කේ අර දෙන්නත් දිගට ජර්සි දාලා කියලා. ඒ වුණාට අපි තුන්දෙනාටම වහන්න බැරි උන තැන් දෙකක් තිබුණා. ඒ තමයි මූණයි කකුල් දෙයයි.අපි ඒවා ගැන ගොඩක් බයෙන් හිටියේ.

ඉස්කෝලෙට යන අතරමග අපි අපි තුන්දෙනා ගැන හොඳ සැලකිල්ලෙන් හිටියේ. ඊට පස්සේ ඉස්කෝලෙට බයිසිකල්වලින් ඇවිත් අපි තුන්දෙනාම වොෂ්

රූම් එකට ගියා. ගිහිල්ලා අත්වල වැව්ලා තිබුණු ඒවායි කකුල් වල තිබුණු ඒවායි ඔක්කොම අයින් කරලා පන්තියට ගියා.

අද අර විභාගයේ දවස. කැතී ප්ලෑන් කරපු විදිහටම ගෙම්බෙක්ට කතා කරලා තිබුණා.ඌ ඇත්තටම හරිම ලොකු ගෙම්බෙක්.අපි පේපරේ ලියන අතරේදී ගෙම්බා ඇවිත් අර ළමයා උත්තර ලියලා තිබුණු කොලේ අරන් පැන ගත්තා. ඒ ගෙම්බා කොලේ අරන් යනවා දැකලා අර ළමයා පුටුවෙන් නැගිටලා ගිහින් දුවන්න පටන් ගත්තා. ඒත් විභාග ශාලාව කලබල කරන්න හොඳ නැති නිසා මැඩම් එයාට ඉඳගන්න කිව්වා. එහෙම කියලා එයාට තව උත්තර ලියන කොලයක් දුන්නා. ඒ ළමයට උත්තර ලියාගන්න බැරි වෙන්න ඇති. අපි තුන් දෙනත් විභාගය ලිව්වා. ටිකක් විතර අමාරු වුනා. මොකද පාඩම් කරේ නෑනේ.

"ඒ වැඩේ නම් නියමයි නේද? කොහොම හරි ඒ ළමයාට අපි හොඳ පාඩමක් ඉගැන්නුවා.." ඇලන් කිව්වා. "ආයේ නම් ඔය වගේ වැඩ කරන එකක් නෑ.. "කැතී කිව්වා.

මේ විදිහට තව දවස් දෙකක් විභාගයේ තිබුණා. ඒවාගෙන් ගොඩක් ප්‍රශ්න පත්‍ර අමාරුයි. එකක් දෙකක් විතරයි ලේසි වුණේ. තුන්වෙනි දවසේ විභාගය ලියලිය ඉද්දි අපේ පන්තියට ප්‍රින්සිපල් මැඩම් ආවා. මැඩම් අපේ ෆයිල් එහෙම ඇරලා උත්තර තියනවද කියලා බලලා යන්න යද්දි මැඩම් අපි තුන්දෙනාට කතා කරා.

"ඒයි ඔය ළමයි තුන්දෙනා, ඔයාලා ඇයි ජර්සි දාගෙන ඉන්නේ මේ දවස්වල වැඩිය සීතල නෑනේ?"

ඇලෙන් මැඩම්ට උත්තර දෙන්න නැගිට්ටා.

"මැඩම් අපි තුන්දෙනාට ටිකක් උණ වගේ ඒ හින්දා අම්මලා දාගෙන ඉන්න කිව්වා."

"තුන්දෙනාටම එකවර උන හැදෙන්න පුළුවන්ද?"

"මැඩම් අපි තුන්දෙනාම ඉන්නේ එකම ගමේ. අපි තුන්දෙනා අසල්වැසියෝ. නත්තල් කාලෙදි අපි තුන්දෙනා හිමේ සෙල්ලම් කරා. ඒකෙන් උණ හැදුනා. සතියක් විතර ඒක තිබුණා. තාමත් අඩු වෙලා නෑ මිස්."

"ආ.. ඒකත් එහෙමද ?හරි හරි පේපරේ ලියන්න. වෙලාව මදි වෙයි. ඒක හින්දා දැන් ඔය ළමයා හිඳගෙන ලියන්න."

ඇලන් කියපු බොරුව එවෙලේ මැඩම් විශ්වාස කළත් ප්‍රින්සිපල් මැඩම් ගියාට පස්සේ කැතී හයියෙන් කැස්සා. ඒ අපිට අසනීපයි කියලා පෙන්නන්න . පේපරේ ලියලා ඉවරයි උනාට පස්සේ අපි තුන් දෙනා ළඟට සූසී ආවා. එයා මහා වදකාරියක්.

"ඔය තුන්දෙනාට සතියක් පුරාවට උණ හැදිලා තිබුණා නම් ඇයි ඊයෙයි පෙරේදයි ජර්සි දාන්නෙ නැතුව අද දැම්මේ?"

ඇත්තටම දැන් මොකද කරන්නේ කියලා මට හිතාගන්න බැරි වුණා. ඊට පස්සේ ඉඳගෙන හිටපු පුටුවෙන් ඇලන් නැගිට්ටා.

"ඊයේයි පෙරේදායි ජේසි දැම්මෙ නැති නිසා අපිට හොඳටම උණ හැදුනා. ඒකයි අද දැම්මෙ. පේපරයක් ලියන්න තියෙන නිසා ඉස්කෝලේ එන්න කියලා අම්මා අපිට බල කරා."

"ඕ.. ඒකත් එහෙමද? එහෙනම් කමක් නෑ" කියලා සූසී යන්න ගියා.

"අම්මෝ ඔයා නම් බොරු කියන්න ඉපදිලා ඉන්න ළමයෙක්"

"හැම ළමයෙක්ටම හැකියාවක් තියෙනවා කැති. මෙයාගේ හැකියාව කපටිකම වෙන්න ඇති"

"හේයි මට අනම් මනං කියලා හරියන්නේ නෑ. ස්තූති කරන්න."

"ස්තූතියි ඇලන් රැජිනියනි" කැතී නොෘක්කාඩුවට වගේ කිව්වා.

"විහිළු කරන්න වෙලාවක් නෙවෙයි. එන්න ඉක්මනටමේක තව කෙනෙක් දකින්න කලින් වොෂ් රූම් එකට ගිහිල්ලා වැඩ පටන් ගමු."

අපි ඔක්කොම ගිහිල්ලා වැඩ කරගෙන ආවා .මගේ කොණ්ඩෙ වැඩියෙන් කපපු නිසා හරි ගානට වැවිලා තිබුනා. ඒ නිසා ආයෙත් කැපුවා.

"මේක බලයකටවත් වඩා වදයක් කියලයි මට නම් හිතෙන්නේ"

"ඔව් අනේ මේ දේ හින්දා අපි කීයක් නම් බොරු කිව්වද? අම්මලාටත් අපි බොරු කිව්වා. කැතී  කිව්වා.

"අයියෝ ළමයි ඇයි ඔයාලා ඕක ගැන ඔච්චර හිතන්නේ. මං වගේ ඉන්න බලන්නකෝ."

ඔයාට නම් තියෙන්නේ මුල් ගලවලා අයින් කරන්නනේ. ඒක නිසා ප්‍රශ්නයක් නෑනේ."

"එහෙමද හිතාගෙන ඉන්නේ. මේ...."

එයා අපිට ජර්සියේ අත ටිකක් නමලා පෙන්නුවා.

"මේ මුල් ඔක්කොම පටන්ගෙන තියෙන්නේ මගේ අතේ තියෙන කෙස් වලින්. ඒ වගේම මගේ කොන්ඩෙන්. හිතන්නකෝ මේ විදියට හැම කෙස් ගහක්ම මුලක් වෙන්න පටන් ගත්තහම මට ඔළුවේ කෙස් නැතිවෙයි. තට්ට ඔලුවක් තියාගෙන ඉන්න ගෑණු ළමයෙක් කොහොම වෙයිද කියලා කියන්න ඕනි නෑ නේ"

"හරි හරි අපි තුන්දෙනාම පැටලිලා ඉන්නේ ගොඩක් ලොකු අමාරුවක. දැන් ඕවා ගැන කතා කරළා වැඩක් නෑ.  එන එකකට මුහුණ දෙනවා කියලා හිතාගෙන යමු පන්තියට."

ඊළඟ දවසේ අපිට විභාගයේ ප්‍රතිඵල දුන්නා. අපි තුන්දෙනාගෙන් එක්කෙනෙක්ටවත් හවස ඉන්න ඕනි වුනේ නැහැ කියලා මැඩම් කිව්වහම අපි ගොඩක් සතුටු වුනා. ඒ වගේම මැඩී, ඒ කියන්නේ පන්තියේ පළවෙනියාටයි සුසීතයි දෙන්නටම හවස ඉන්න වෙනවා කියලා දැනගත්තහම අපි සතුටු වුණා. හිතුවට වැඩිය විභාගෙට මට ලකුණු තිබුණා. හැම විෂයකටම වගේ අනූ ගණන් තිබුණා. ඉතිහාසයටත් !මට ඇත්තටම සතුටු හිතුනා. කැතීටත් හොඳ ලකුණු තිබුණා. ඇලන් නම් නූලෙන් වගේ බේරිලා තිබුණා. 'මේ ලකුණු රිපෝට් එකට දැම්මනම් 'කියලා මට හිතුනා. අම්මටයි තාත්තටයි මං ගැන ආඩම්බර හිතුනා. ඒත් ආපහු වාර අවසාන විභාගෙටත් මේ ලකුණම ගන්න ඕනේ කියලා අම්මා කිව්වට පස්සේ මට ඇයි මම ලකුණු ගත්තේ කියලා හිතුනා.

# කැම්ප් එක

මේ විදිහට කොහොම හරි අපේ ඇගේ තිබුණු ලොම් ටික අපි හංග ගෙන දවස් ගානක් හිටියා. ඉස්කෝලේ හිටියෙත් පුදුම බයකින්, ගෙදර හිටියෙත් පුදුම බයකින්. මේක ගැන අම්මලාටත් නොකියා ඉන්න තීරණය කරානෙ. දැන් ඉතින් අම්මලාට කියන්නේ නැතුව මේක මේ විදිහට තියාගෙන ඉන්නවා කියන්නේ මාර අමාරු දෙයක්. ඇත්තටම නත්තල් සීයා අපිට දුන්නේ බලයක්ද වදයක්ද කියන එක නම් තාමත් මට තේරෙන්නේ නෑ. කැතීටයි ඇලන්ටයිනුත් දැන් මේකෙ එපාවෙලා. එකක් කපනවා ආයෙ වැවෙනවා. ආයෙ කපනවා ආයේ වැවෙනවා. කිසිම ඉවරයක් නැති නිසා අපි තුන්දෙනාටම දැන් මේක එපා වෙලා තිබුනේ. ඇත්තටම දැන් මොනවද කරන්නේ කියලා අපිටත් කිසිම අදහසක් තිබුණේ නෑ. ආයෙත් සැරයක් මේ බල නැති කරන්නත් අපිට ඊළඟ නත්තල වෙනකන් ඉන්න ඕනි කියලයි මට නම් හිතෙන්නේ. මොකද මම විශ්වාස කරන්නේ නම් මේක නත්තල් සීය දුන්නා කියලා. ඒ වුනාට ඉතින් නත්තල් සීයගෙන් බල විතරක් ඉල්ලුවා නම් ඇයි එයා අපිට මේ විදිහට වදයකුත් දුන්නේ? කැතීටයි ඇලන්ටයිනුත් දැන් මේකෙ එපාවෙලා තිබුණා.

එදා දවසේ අපිට බාල දක්ෂ වැඩ අය පටන් ගත්තා. මේ අපි බලදක්ෂ වලට නිවාඩුවෙන් පස්සේ යන පළවෙනි දවස. අපි ගියාට පස්සේ අපේ මැඩම් අපිට මෙහෙම කිව්වා.

"ළමයි ඊළඟ සති අන්තයේදී අපි කැම්ප් එකක් යනවා. . මේ කැම්ප් එකේදි අපි යන්නේ එක ගමකට. ගිහිල්ලා එහෙ තියෙන දේවල් අධ්‍යයනය කරලා ඒ දේවල් අපි ඔයාලට කියලා දෙනවා.ඒ අත්දැකීම් අපි ඔයාලට දෙනවා ඒක නිසා ඔයාලා මේ කැම්ප් එකට යන්න කැමතිනම්, කැමති අය අම්මලාට කියලා කැමැත්ත අරගෙන එන්න. පුළුවන් නම් ලියුමක්ම ලියාගෙන එන්න."

"බාල දක්ෂ වලට තාමත් ඇලන් බැඳිලා නැති නිසා මේ චාරිකාව ඇලෙන්ට යන්න වෙන්නේ නැති වෙයි නේද?" කැතී කිව්වා.

"ඔව් මේ චාරිකාවට නම් එයාට යන්න වෙන්නේ නෑ. මොකද එයා කලින්ම බැදුනේ නෑනේ. නිවාඩුව ඉවර වෙච්ච දවස්වලම එයා බැදුනා නම් එයාටත් අපිත් එක්ක යන්න තිබ්බා."

"මේ කැම්ප් එක සතියක් විතර තියෙයි නේද?"

"ගිය සැරේ එකත් සතියක් විතර තිබුණනේ. මේ සැරේ එකත් සතියක් තියෙයි. ඉන්න මං මිස්ගෙන් අහලම බලන්න."

ඊට පස්සේ මම මිස්ගෙන් ඒක ගැන ඇහුවා. මේ සැරේක සති දෙකක් තියෙනවා කියලා මිස් අපිට කිව්වා.

"පව් ඇලන්, එයාට දැන් සති දෙකක් අපි නැතිව ඉන්න වෙනවනේ" කැතී කිව්වා.

"මොනවා කරන්නද? දැන් කරන්න දෙයක් නැහැනේ. එයාට තනියෙන් ඉන්න වෙනවා."

මේ ට්‍රිප් එකට ඇලන් ආවේ නැහැ. මොකද ඇලන්ට බාල දක්ෂිකා සංගමයේ සාමාජිකත්වයේ තිබුණේ නෑ. ඒ වුනාට මටයි කැතිටයි දෙන්නටම සාමාජිකත්වය තිබුණා. මේ සැරේ අපි යනවා කියලා කිව්වේ කෞතුකාගාරයකට ඒ කෞතුකාගාරයට ගිහිල්ලා පස්සේ එහෙන් ගමකට යනවා කියලා කිව්වා. ඒ ගමේ තියෙන දේවල් හොඳට අධ්‍යයනය කරලා ඊට පස්සේ අපි කැම්ප් එකක් ගහගෙන ඉන්නවා කියල තමයි බාල දක්ෂිකා සංගමයේ අපිව භාරව ඉන්න මැඩම් අපිට කිව්වේ . මේ ට්‍රිප් එක දවස් හතරක් අපි යනවා කියලත් මැඩම් කිව්වා.

මේ ට්‍රිප් එක යන්න කැමති ළමයි අම්මලාගෙන් අවසර අරගෙන එන්න කියලා මැඩම් කිව්වා. මමයි කැතියි දෙන්නම හිටියේ සතුටින්. ඒ වුනාට ඇලන්ට මේ ට්‍රිප් එක යන්න වෙන්නේ නෑ. අපි අම්මලාගෙන් මේ ගැන අහන්න ගෙදර ගියා.

" අම්මේ, මට මේ සැරේ තියෙන ට්‍රිප් එක යන්න පුළුවන්ද? මැඩම් අපිට ඔයාලගෙන් අවසර අරන් එන්න කිව්වා. "

" මේ සැරේ ට්‍රිප් එක නම් යවන්න විදිහක් නෑ පුතේ "

" ඇයි අම්මා එහෙම කියන්නේ. ගිය සැරේ ඔයා මාව යැව්වනේ. "

"කිව්වනේ බෑ කියලා.ආයේ තර්ක විතර්ක නෑ."

" ඒ වුනාටමම මේ ට්‍රිප් එකට කැතිත් යනවා.ඇයි මට යන්න දෙන්නේ නැත්තේ. "

"ඔයාට යන්න දෙන්න බෑ. මං කිව්වනේ."

" මං තාත්තාගෙනුත් අහලා බලන්නද?

තාත්තාගෙන් අහල බලන්න දෙයක් නෑ. තාත්තයි මම එකතුවෙලා ගත්ත තීරණයක් තමයි මේක. දැන් කට වහගෙන යන්න. "

"අම්මේ මේකට කැතිත් යනවනේ " මම බැගෑපත් වුනා.

"නැහැ කැතී මේ ට්‍රිප් එක යන්නෙත් නෑ. කැතීගේ අම්මයි මමයි ඔයාගේ තාත්තයි කැතීගෙ තාත්තයි හතර දෙනාම එකතු වෙලා ගත්ත තීරණයක් තමයි

මේක. ඒක නිසා ඒ තීරණයෙන් පිට යන්නේ නැතුව ඔයාලා දෙන්නම ගෙදර ඉන්න ඕන."

ඇයි එහෙම කියන්නේ. ඇයි අපිට යන්න දෙන්නේ නැත්තෙ. මොකක්ද හේතුව??"

" ඔයාට කොහොමත්ම යන්න දෙන්න බෑ. "

"මොකක්ද හේතුව අම්මේ? ඇයි යන්න දෙන්නේ නැත්තේ."

"ඒකට හේතුව ඔයාට පස්සේ තේරෙයි. ඒත් දැන් යන්න දෙන්න බෑ."

" අනේ අම්මේ, මේක අපි බාල දක්ෂිකා සංගමයෙන් කරන දෙයක්නේ. ඇයි යන්න දෙන්නේ නැත්තේ. "

" යන්න රීටා. ඔය ප්‍රශ්න ගැන දැන් කතා කරල වැඩක් නෑ. කොහොමත්ම තීරණේ වෙනස් වෙන්නේත් නෑ. "

# මල්ලි

මොනවා කිව්වත් අපේ අම්මලා අපිට ට්‍රිප් එක යන්න දුන්නේ නෑ. යන්න දුන්නේ නැති එකට හේතුව ඇහුවාම අම්මලා කොහොමහරි ඒක මඟ ඇරියා. තාත්තගෙන් ඇහුවට තාත්තා කිව්වෙත් නෑ. මාගේනුයි කැතීගෙනුයි අහන්නේ නැතුව මේ වගේ තීරණයක් ගත්ත එකට අපි දෙන්නම කැමති වුණේ නෑ. මොනවා කිව්වත් අම්මලා අපිට හේතුව නම් කිව්වේ නැහැ.

මල්ලි හම්බෙන්නත් දැන් ළඟයි. අම්මා හොස්පිටලුත් අරන් ගියා. මං මල්ලි එනකල් හිටියේ ගොඩක් ආසාවෙන්. මොකද මට සහෝදරයෙක් හිටියේ නැනේ.මල්ලි හින්දා තිබුණු ප්‍රශ්න ඔක්කොම වගේ අපිටත් අමතක වුණා. මොන ප්‍රශ්නය අමතක උනත් අර ඇඟේ ලොම් මතු වෙන එකයි, කෙස් මතු වෙන එකයි, මුල් මතු වෙන එකයි නම් නැවතුනේ නෑ. අපි තුන්දෙනාට දිගටම ඒක ෂේව් කරන්න වුණා.එක අතකට කැතී කියපු දේ හරි ගියා මට හිතුණා. ඒ කියන්නේ අපේ බලය අනුව අපේ ශරීරය වෙනස් වෙනවා. මොනවා උනත් මල්ලි ලැබෙන්න කිට්ටු වෙලා නිසා මං හිටිය ගොඩක් සතුටින්. එදා සති අන්තයේ සෙනසුරාදා අම්මට ගොඩක් අමාරු වුනා. අම්මාව හොස්පිල් එකට ගෙනිච්චේ කැතිගේ තාත්තාගේ කාර් එකේ.අපේ තාත්තත් ගියා.මම ආවේ කැතිගෙ අම්මා එක්ක. මල්ලි ඉපදුනාට පස්සේ මම හිටියේ ගොඩක් සතුටින්. මල්ලි රෝසම

රෝස පාටයි. ලස්සනයි. එයාට අපි නික් කියලා නම දැම්මා. මල්ලිව දැකලා අම්මත් සතුටු වුනා.තාත්තත් සතුටු වුනා. කැතිත් එයාට ආස උනා. ඇලනුත් එහෙමයි.

මං නිකන් ඉන්න  වෙලාවට මල්ලිව හුරතල් කරා. මල්ලි හරි හොඳයි. මල්ලිව බලන්න ගොඩක් අය අපේ ගෙදරට ආවා. මල්ලි හැමතිස්සෙම වගේ නිදාගත්තා. මම ඒකට කැමති උනේ නෑ. මොකද මට ඕන වුනේ එයත් එක්ක සෙල්ලම් කරන්න.ඒ උනාට ඉතින් එයා තාම පොඩියිනේ.

" නික් ශෝක් නේද?" එදා ඉස්කෝලේ යන ගමන් කැති කිව්වා.

" ඔව් අනේ මමත් එයාට කැමතියි "ඇලනුත් කිව්වා.

"මල්ලි හරි ෂෝක් නේද? එයා  හරි ලස්සනයි.

" ඒක නෙවෙයි ඔයාලට හිතෙන්නේ නැද්ද අපි මේ අපේ බලයන් ගැන අම්මලාට කිව්වොත් හොඳයි කියල" කැති එකපාරටම කිව්වා.

" ඔයාට පිස්සු ද? අපේ  අම්මලාට කියන්න? එයාලා හිතයි අපිට පිස්සු කියලා. "

"හැම දෙයක්ම අසුභවාදී  විදිහට හිතන්න එපා. අපිට මේ විදිහේ ප්‍රශ්නයක් තිබුණහම අපි ඒ දේවල් වැඩිහිටියන්ට අනිවාර්යෙන් කියන්න ඕනේ. නැත්නම් කොහොමද මේ වගේ ප්‍රශ්නෙකින් අපි බේරෙන්නේ.?"

" අපි කලිනුත් මේ ගැන තීරණයක් ගත්තා නේද? අපි පොරොන්දු වුණානේ අම්මලාට අපි මේ ගැන කියන්නෙ නෑ කියලා. මොකද අම්මලා මේවා

දැනගත්තොත් එහෙම ඊට පස්සේ මානසික රෝහලකට අපි තුන්දෙනාව එක්කන් යයි. "

"එහෙම වෙන්නේ නෑනේ. අපේ ඇඟේ තියෙන දේවල් අම්මලාට පෙන්නුවාම අම්මලා කොහොමද අපිව මානසික රෝහලකට ගෙනියන්නේ?"

" ඇඟේ තියෙන දේවල් දැක්කොත් අම්මලාට පිස්සු හැදෙයි. "

"අනිත් එක අම්මලා විශ්වාස කරයිද අපිට මේක නත්තල් සීයා දුන්න තෑග්ගක් කියල. අම්මලා හිතයි අපිට පිස්සු කියලා" මමත් කිව්වා.

"මේ ප්‍රශ්නේ නම් මහ වදයක්.කවදා ඉවරයක් වෙයිද දන්නෑ."

" මම ළමා නිවාසෙදි අපිව බලා ගත්තු මැඩම්ට කරපු නරක දේවල් හින්ද දන්නෙ නෑ නත්තල් සීය මගේ ප්‍රාර්ථනාව ඉෂ්ට කරලා මේ වගේ දඬුවමක් දුන්නේ. "

" මමත් මොනවා හරි නරක වැඩක් කරලා ඇති. ඒක හින්ද වෙන්නැති මටත් මේ විදියේ දඬුවමක් දුන්නේ." මමත් කිව්වා.

" මෝඩයෝ දෙන්නා නත්තල කියන්නේ දඬුවම් දෙන කාලයක් නෙවේ. ඒක හින්දා නත්තල් සීයා කවදාවත් ඔහොම කරන්නේ නෑ. ඒත් මට හිතෙනවා මේ බලය අපිට දුන්නේ නත්තල් සීය නෙවෙයි කියල. "

" ඔයා කොහොමද එහෙම කියන්නේ? වෙන කවුරු මේ බලය අපිට දෙන්නද? "

"මොනවා හරි විද්‍යාත්මක හේතුවක් මේකට ඇති කියලා ඔය දෙන්නට හිතෙන්නේ නැද්ද?" කැතී කිව්වා.

" විද්‍යාත්මක හේතුවක් තිබ්බ කියන්නකෝ. කොහොමද හොයාගන්නේ?"

"ඒක නෙවේ ළමයි අපි දැන් ඉස්කෝලේ ළඟටම ආවා  දැන් අපි යමු .'

උත්තරේ හමු වුණා

සති අන්තයෙදී ඔක්කොම ගෙදර වැඩ ඉවර කරලා මම නිදාගන්න ගියා.මට මොකක් හරි ලොකු අමුත්තක් දැනුනා. ඒත් ඒ මොකක්ද කියලා හරියටම තේරුනේ නෑ. හරියට නින්ද ගියෙත් නෑ. ඊට පස්සේ අන්තිමේදි මම හිතන්නේ දහයට විතර මට හොඳටම නින්ද ගියා.

ඊළඟ දවසේ මං ඇහැරුනේ ෆෝන් එක හයියෙන් රිං වෙනවා කියලා දැන ගත්තායින් පස්සේ.ඒක නවතින්නැතුව රිං වෙන්න පටන් ගත්තා. ඇයි කියලා මට තේරෙන්නෙත් නැහැ. මගේ මම ඇස් දෙක ඇරියට පස්සේ මට තේරුණා මොනවා හරි දැන් මගේ ඇස් දෙක උඩ තියෙනවා කියලා.ඒක අයින් කරාමයි මට තේරුනේ මගේ මුළු ඇඟම මගේම කෙස් ගස් වලින් වැහිලා කියලා. ඇඳෙන් පල්ලෙහාටත් එක්ක කෙස් ගස් දික් වෙලා තිබ්බා. ඊට පස්සේ මම ෆෝන් එක ගත්තා. කැතියි ඇලනුයි දෙන්නම මට කෝල් කරලා තියෙනවා මම දැක්කා.මම කන්නාඩි මේසෙට ගිහිල්ලා බැලුවාම මට මාවත් අඳුරගන්න බැරි උනා.

ඊට පස්සේ මම කැතිට කෝල් එකක් ගත්තා.

" ඒයි නිදි කුම්බා, තාමත් නිදිද? මෙච්චර කෝල් ගත්තහම නැගිටින්න දන්නේ නැද්ද මගේ මුළු ඇඟම ලොම්වලින් වැහිල! මොකද කරන්නේ? ඇලන්ගේ

ඇඟත් සම්පූර්ණයෙන්ම මුල් වලින් වැහිලා. කණ්නාඩි මේසෙට ගියාට පස්සේ අපි දෙන්නට අපි දෙන්නවත් අඳුරගන්න බැරි වුණා. බලන්න ඔයාගෙත් එහෙම වෙලාද කියලා. "

" ඔය දෙන්නටත් එහෙම වුණාද? මගේ ඇඟත් සම්පූර්ණයෙන්ම කෙස් වලින් වැහිලා. මොනවද දැන් කරන්නේ?දැන් නම් අම්මලාට මාට්ටු වෙනවා ෂුවර්. මොකද අපි දැන් කරන්නේ ?"

" අඩුම මට මාවත් අඳුරගන්න බැහැ රීටා. මාව අම්මා දැක්කොත් උඩ යයි. "

" මටත් ඒකමයි තියෙන ප්‍රශ්නේ.මටවත් මාව අඳුරගන්න බෑ. "

" රීටා අපිට දැන් නම් මේක අම්මලාට කියන්නම වෙනවා. "

"ඒක තමයි මාත් කල්පනා කරේ. ඒ වුනාට අම්මලාට කිව්වා කියලා වැඩක් වෙයිද?අම්මලා අපිව විශ්වාස කරයිද? අඩුම අපිටවත් අපි අඳුරගන්න බැරි එකේ අම්මලාට පුළුවන් වෙයිද අපිව අඳුරගන්න?"

"මෙච්චර දවසකට කවදාවත් මෙහෙම වෙලා නෑ. පොඩ්ඩයිනේ ඇවිල්ලා තිබ්බේ. මේක මේ මුලු ඇඳක් පිරෙන්නම වැවිලානේ."

" මගෙත් එහෙමයි. ඇලන්ගෙත් එහෙමද? "

" ඔව් එයාගෙත් එහෙමයි. "

"ඉන්න,මං මේ කෝල් එකට ඇලෙන්වත් එකතු කරන්න."

ඊට පස්සේ මම ඇලන්ට කතා කරා.

" රීටා,මොකක්ද මේ වෙලා තියෙන්නේ? කොහොමද මේවා දැන් ඇඟෙන් අයින් කර ගන්නේ? "

"අපිට මේ ගැන අම්මලාට කියන්නම වෙනවා."

" අනේ අපොයි කැති, රීටා,අපේ අම්මා දොරට ගහනවා. "

"මොනවද දැන් කරන්න හිතාගෙන ඉන්නේ?"

" තවත් ඉතින් මොනවා කරන්නද?මං මේක අම්මට කියනවා . "

"පොඩ්ඩක් ඉන්න. ඔයා අම්මට කියනවද මේක ගැන?"

' කියන්න වෙනවනේ. මොනවා කරන්නද? "

"හොඳයි එහෙනම් මමත් අම්මට කියනවා."

"කියන්න දෙයක් නෑ.තව චුට්ටකින් අපේ අම්මත් මගේ කාමරේ  දොරට ගහයි. "මම කිව්වා.

අපි අපේ කෝල් එක කට් කරලා වැඩි වෙලාවක් යන්න කලින් අපේ අම්මත් දොරට ගැහුවා.

" මොනවද ළමයෝ කාමරය ඇතුලේ පැලවෙලාද? ඉස්කෝලේ යන්නේ නැද්ද? "

" අම්මේ,පොඩ්ඩක් කාමරය ඇතුළට එනවද? "

" දොර ලොක් කරලා තියෙද්දි කාමරය ඇතුලට එන්න පුළුවන්ද? "

"හැබැයි ඔයාට සිද්ද වෙනවා මාව විශ්වාස කරන්න."

"මොන මඟුලක්ද මේ කියවන්නේ?දොර අරිනවා."

මම දොර ඇරියා. ඒ වුනාට අම්මා පොඩ්ඩක්වත් පුදුම වුණේ නෑ. අම්මා හයියෙන් හිනා වුණා.

" අම්මේ, මොකද? ඇයි හිනා වෙන්නේ? මොකක්ද මෙතන වෙන්නේ? ඔයා මේ ගැන මොනවා හරි දන්නවද? මට කිසි දෙයක් තේරෙන්නෑ. "

" ඔයා පොඩ්ඩක් ඇඳේ ඉඳගන්නකෝ.මං ඔයාට කියන්නම් මෙතන මොකද උනේ කියලා. "

"පුතේ, එක දෙයක්. ඔයා මගෙන් මේ දේ හැංගුවා නේද?"

" මට සමාවෙන්න.  මම ගොඩක් බයවුනා. ඇත්තටම මේ දේ උනායින් පස්සේ... "

" ඉස්සෙල්ලම කියන්නකෝ බලන්න හම්බවෙච්ච බලය මොකක්ද කියලා . "

" ඔයා ඒ බලය ගැනත් දන්නවද? "

"කට වහගෙන කියන්නකෝ."

" මට මිනිස්සුන්ගේ හිත් කියවන්න පුළුවන්. "

" ඉතිං ඔයාට මගේ හිත කියවන්න පුළුවන්ද? "

" මට තියෙන ලොකුම ප්‍රශ්නයක් ඒක. ඇත්තටම මට මේ ගමේ ඉන්න කිසි කෙනෙක්ගේ හිත කියවන්න බෑ. "

"ඇයි කියලා හේතුව කවදාහරි හෙව්වද?"

" හෙව්වට හම්බු නේ නෑනේ."

" හරි දැන් ඔයාට කිසි දෙයක් හංගන්න ඕනි නෑ .මං  කියන්නම්. "

" මේ අහන්නකෝ ඔයා මේක විශ්වාස කරන එකකුත් නැහැ. මේ ගමේ අවුරුදු දොළහට වැඩි හැමෝටම මොකක් හරි බලයක් තියෙනවා. "

අම්මා එහෙම කිව්වහම මං පුදුම උනා.

"බලයක් තියෙනවා. ඒ මොන බලය ද?"

" මැදින් කොසු දාන්නැතුව ඉන්නකෝ. මං කතාව කියනකන්. "

"ගමේ අවුරුදු දොළහට වැඩි හැමෝටම මොකක් හරි බලයක් තියෙනවා. උදාහරණයක් විදිහට ගත්තොත් මට තියෙන බලය තමා මට ගොඩක් රසට උයන්න පුළුවන් එක. එතකොට ඔයාගේ තාත්තට හොඳට ගහගන්න පුළුවන්. කැතීගෙ තාත්තට හොඳට කාර් එලවන්න පුළුවන්. කැතීගෙ අම්මට අනිත් අය එයාට වශී කරගන්න පුළුවන්. ඒ එයාගේ ලස්සනෙන්. ඒ විදිහට අවුරුදු දොළහට වැඩි හැමෝටම බලයක් තියෙනවා. ඒක හම්බවෙන්නේ අවුරුදු දොළහ පහු උනාම.දැන් ඔයාලා තුන්දෙනාටම අවුරුදු 12 පහු වෙච්ච නිසා තමා ඔය බලය ලැබිලා තියෙන්නේ. ඒක ඒ වයසට වෙන දෙයක් ඔයාගේ ඇඟ වෙනස් වෙලා තියෙන්නේ කෙස්වලින් වැහිලා තියෙන විදිහට. මගේ ඇඟ වෙනස් වෙලා තියෙන්නේ ගොඩක් පොඩි වෙන්න. මං පොඩි වෙලා පොඩි වෙලා අන්තිමේදී ලේනෙක්ගේ තරමට පොඩි වෙනවා. ඒක සාමාන්‍ය දෙයක්. "

" සාමාන්‍ය දෙයක්? මට මේ කිසි දෙයක් තේරෙන්නේ නෑ. මොනවද මේ වෙන්නේ? "

"දෝනි ඔයාට තාමත් තේරුනේ නැද්ද? අපි මිනිස්සු නෙවෙයි."

" මිනිස්සු නෙවෙයි! මොනවද මේ අම්මේ ඔයා කියවන්නේ? එහෙනම් අපි කවුද? "

"අපි පිටසක්වල ජීවියෝ "

"පිටසක්වල ජීවියෝ?"

" ඔව් ළමයෝ.. පිටසක්වල ජීවියෝ. ඔයා දැන් ඔහොම්මම කලබල නැතුව ඉන්නකෝ.ඔයාට ඔය තියෙන බාහිර ස්වරූපය විනාඩි පහළොවක් ඇතුලත නැති වෙනවා. එහෙම නැතිවෙන්නේ සම්පූර්ණ බාහිර ස්වරූපය පළවෙනි සැරේට ඔයාට ලැබුණට පස්සේ.නැති වුනාට පස්සේ ඔයාට ආපහු මිනිස් ස්වරූපය ලැබෙනවා. ඊට පස්සේ ඔයාට ඕන වෙලාවකට මිනිහෙක් වෙන්නත් පුළුවන්. ඔයාට ඕන වෙලාවක පිටසක්වල ජීවියෙක් වෙන්නත් පුළුවන්. ඒ බලෙත් ඔයාට හම්බෙනවා. "

" හිතාගන්නත් බෑ. "

" මටත් මුලින්ම ඔය දේ උන වෙලාවේ හිතුවේ ඔය දේමයි. හැබැයි මම නම් අම්මට කිව්වා. ඒක නිසා ගොඩක් ලොකු ප්‍රශ්නයක් වුණේ නෑ. ඔයා ඉතින් ඒක හංගගෙන හිටියනේ. "

" දැන් තමයි මට තේරෙන්නේ ඇයි ඔයාලා ට්‍රිප් එක යන්න දුන්නෙ නැත්තේ කියල. "

"යන්න දුන්නේ නැත්තේ ඔයාල ඔය විදිහට ලොම් කප කප ඉන්නවා කවුරු හරි දැක්කොත් එහෙම ඔයාලාට කරදර කරන්න පුළුවන් නිසා."

" ඇයි අපි මේක මනුස්ස ලෝකෙන් හංගගෙන ඉන්නේ? "

"මනුස්ස ලෝකෙ මිනිස්සු පිටසක්වල ජීවියෝ ගැන හොයනවා කියලා දන්නවනේ. අයාලා අපි පිටසක්වල ජීවියෝ කියල දැනගත්තොත් එහෙම අපිව පරීක්ෂණ වලට ගන්න පුළුවන්. අපිටම කියලා ජීවිතයක් තියෙන්න ඕන නිසයි

අපි මේක හංගගෙන ඉන්නේ. ඔයාලට මේක පොඩි කාලේ නොකියන්නෙත් ඒකයි. පොඩි කාලේ කිව්වොත් බැරි වෙලාවත් ඔයාලගේ කටින් ඒක එළියට ගියොත් එහෙම අපේ මේ රහස සම්පූර්ණයෙන්ම නැති වෙනවා. ඒක නිසයි ඔයාලට නිසි වයසෙදි අපි ඔය දේ කියන්නේ. ඔය දේවල් කලින් කියලා තිබ්බොත් එහෙම ඔයාලා බයවෙලා අනිත් අයට කියන්න පුළුවන්.දැන් ඔයාලට ඒක හුරු හින්දයි අපි ඔයාලට මේ වයසෙදි ඕක කියන්න හිතුවේ."

"අම්මේ මට තවත් ප්‍රශ්නයක් තියෙනවා. අපේ ගමේ විතරයි නම් පිටසක්වල ජීවියො ඉන්නේ, එතකොට ඇලන්?"

" එක දවසක් රොජරික් අංකල් ටවුමට ගියාම ඔය ළමා නිවාසේ පහු කරගෙන ගියාලු. එයා අඳුර ගත්තලු මේ ඉන්නේ පිටසක්වල ජීවියෙක් කියලා. ඒකයි එයා ඇලන්ව අපේ ගමට ගෙනාවේ. මොකද එයා මනුස්ස ලෝකේ හිටියොත් එහෙම කාට හරි එයා ඒ ගැන කිව්වොත්? මනුස්සයෝ ඒක ගැන හොයාගන්න ඉඩ තියෙනව. ඒකයි. සමහර විට මොකක් හරි හේතුවක් නිසා ඇලන්ව මනුස්ස ලෝකයේ මග ඇරෙන්නැති "

"ඒකත් එහෙමද? අද මට ඉස්කෝලෙ යන්න වෙන්නේ නෑ නේද?"

"දැන් ඉතින් පරක්කු වැඩියිනේ. දැන් යන්න වෙන්නෙ නෑ."

" ඔයා දැනගෙන හිටියා නේද මට කවදද මේ දේවල් වුනේ කියලා"

"ඕක ඔයාලට වෙච්ච දවසේ ඉඳලම මම දැනගෙන හිටියා. ඒකනේ මං ඔයාට ට්‍රිප් එක යන්න දුන්නෙත් නැත්තේ."

" දැනගෙන හිටියනම් ඇයි අපිට කිව්වේ නැත්තේ? "

" ඔයාල තුන්දෙනා කොච්චර දුරට අපිව විශ්වාස කරනවාද කියලා තමයි අපි බැලුවේ. "

" ඒකත් එහෙමද? සමාවෙන්න. "

" දැන් අපි බලමුකෝ මල්ලිට මොකද වෙන්නේ කියලා."

" ඒක තමා "

" දැන් විනාඩි පහළොව ඉවර වෙන්නත් ළඟයි. දැන් ඔයාට අර බලය ලැබෙන පටන් ගනී."

එහෙම කියලා අම්මා කාමරෙන් ගියා.ඇත්තටම විනාඩි පහළොවක් යද්දි මම ආපහු මනුස්සයෙක් විදිහට හැරෙන්න පටන් ගත්තා. පිරිසක්වල ජීවියෙක් වෙලා ඉන්න එකත් එක අතකට මාරයි කියලා මට හිතුනා. මෙච්චර කාලයක් පිටසක්වල ජීවියෙක් කියලා දැනන් හිරිය නැති එකටත් මං පුදුම උනා. ඇත්තටම ඒක මාර අත්දැකීමක්.

*****

" මට නම් තාමත් විශ්වාස කරන්න බෑ මම පිරිසක්වල ජීවියෙක් කියලා. "එදා කැති ඉස්කෝලෙ යන ගමන් කිව්වා.

" පිටසක්වල ජීවියෝ කියලා ජාතියක් මේ ලෝකේ ඉන්නවා කියලා මිනිස්සු විශ්වාස කරනවනේ. දැන් ඉතින් අපි දන්නවානේ ඇත්තටම එහෙම ඉන්නවා කියලා. " ඇලන් කිව්වා.

" ඉතින් ළමයි.අපිට දැන් අපේ ප්‍රශ්නෙට උත්තරේ හම්බුනා නේද?"මම කිව්වා.

" ඒක තමයි.එහෙනම් කියමුකෝ බලන්න අපි කවුද කියලා. " කැතී කිව්වා.

" අපි පිටසක්වල ජීවියෝ..." අපි තුන්දෙනාම එක වැර හයියෙන් කිව්වා.

# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල් වන සාහිත්‍ය ප්‍රබෝධයත් අධ්‍යාපනය ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණය කරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප් නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරිමාර්ථ ඇතිව දෙදා 2017 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසා දරුවන් ග්‍රන්ථකරණයකට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කේතයේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාවය වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප පළාත් සහජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි දී මහාමායා බාලිකා විද්‍යාලය විදුහල්පතිතුමිය දියණියන් ගුරුබවතුන් දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැපකිරීමට ජාතියේ ප්‍රණාමය හිමි විය යුතුය

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි පොතකින් දරුවකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය මගින් ගලපමින් දැනට වසර දෙකක සිට රටේම පාසා දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාම මහාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම

නිසග සාහිත්‍ය නිර්මාණ හැකියාව ◌න් එයට පිවිසි පුංචි ගත් කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,

සෙනෙවිරත්න මහලේකම්